2013.12.31

චක්‍රලේඛ අංක : 15/2013

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>ඔප්පු වලට අලවා ඇති අඩු මුද්දර ගාස්තු සහ හිඟ දඩ මුදල් අය කර ගැනීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් අමතන ලද මගේ සමාංක හා 2013.01.09 දින දරණ චක්‍රලේඛ ලිපියට අමතර වශයෙනි.

02. නොතාරිස්වරුන් විසින් ඔප්පු ලියා සහතික කිරීමේදී හිඟ සහ දඩ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් සියළුම කාර්යාල වල එකම ආකාරයකින් කටයුතු කිරීම සිදු නොවන බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් විකුණුම් සහ තෑගි ඔප්පු වලට අදාල හිඟ සහ දඩ මුදල් අය කර ගැනීමේ ක්‍රමවේදය වැඩි දියුණු කිරීම පිළිබඳව සියළුම පළාත් ආදායම් කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡාවක් 2013.12.10 වන දින මගේ ප්‍රධානත්වයෙන් මෙම කාර්යාලයේදී පවතවන ලදී. එකී සාකච්ඡාවේ දී ගනු ලැබූ තීරණ කිහිපයක් පහත සඳහන් වේ.

2.1. ප්‍රඥප්තිවල සඳහන් නියමයන් අනුව රු. 5000 ක් හෝ ඊට අඩු හිඟ මුද්දර ගාස්තු අයකිරීම පිළිබඳ කටයුතු ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සිදුකිරීම

2.2. හිඟ මුද්දර ගාස්තුව රු. 5000 ක් හෝ ඊට අඩු අවස්ථාවලදී අයකරනු ලබන දඩ මුදල 25% ක් බවට තීරණය කිරීම

2.3. අයකරන ලද හිඟ මුද්දර ගාස්තුව සහ දඩ මුදල පිළිබඳ විස්තර පළාත් ආදායම් කොමසාරිස්වරුන්ට සෑම මාසයක් අවසානයේ පහත සඳහන් ආදර්ශයට අනුව සකස් කරන ලද වාර්තාවක් යැවීම සහ එහි පිටපතක් ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරී වෙත එවීම.

| දිනය | නොතාරිස්ගේ නම | ඔප්පුවේ අංකය | ඔප්පුවේ දිනය | වටිනාකම | නියමිත මුද්දර ගාස්තුව | ගෙවා තිබූ මුද්දර ගාස්තුව | අයකරන ලද | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | හිඟ මුදල | දඩ මුදල | දිනය |
| | | | | | | | | | |
| | | | | | | | | | |

2.4. රු. 5000 ට වැඩි හිඟ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් කටයුතු කිරීම

මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම පළාත් ආදායම් කොමසාරිස්වරුන්ට පැවරෙන අතර ඒ සඳහා සෑම මාසයක් අවසානයේදී පහත සඳහන් ආදර්ශයට අනුව සකස් කරන ලද වාර්තාවක් අදාළ ඔප්පුවේ සහතික පිටපතක්ද සමඟ පළාත් ආදායම් කොමසාරිස්වරුන්ට යැවීම.

| දිනය | නොතාරිස්ගේ නම | ඔප්පුවේ අංකය | ඔප්පුවේ දිනය | අයකරන ලද | | |
|---|---|---|---|---|---|---|
| | | | | හිඟ මුදල | දඩ මුදල | දිනය |

2.5. පළාත් ආදායම් කොමසාරිස්වරුන් විසින් අයකරන ලද හිඟ දඩ මුදල් පිළිබඳ විස්තර ඉහත සඳහන් ආදර්ශ අනුව සෑම මාසයකම ආපසු ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්ට දැන්වීමෙන් අනතුරුව අදාළ ලේඛණවල ඒ බවට සටහන් යෙදීම.

03. මින් ඉදිරියට පැවරුම් හා විකුණුම්වලට අදාළ ඔප්පුවල හිඟ හා දඩ මුදල් අයකිරීම සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති තීරණ පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්න.

04. මීට අමතරව මගේ සමාංක සහ 2013.01.09 දින දරණ චක්‍රලේඛය මගින් උපදෙස් දී ඇති පරිදි 2011.12.31 දක්වා ඔබ විසින් පනවන ලද හිඟ මුද්දර ගාස්තු සහ දඩ මුදල් අය නොකරගත් නොතාරිස්වරුන්ගේ විස්තර අදාල පළාත් ආදායම් කොමසාරිස්වරුන් වෙත මෙතෙක් යවා නොමැති නම් එකී විස්තර අදාල ඔප්පු වල පිටපත් ද සහිතව හිඟ සහ දඩ මුදල් අය කර ගැනීමට අදාල පළාත් ආදායම් කොමසාරිස්වරුන් වෙත යැවීමට පියවර ගන්න. එසේ 2011.12.31 දක්වා අය කර ගැනීමට ඔබ විසින් පනවන ලද හිඟ දඩ මුදල හෝ පළාත් ආදායම් කොමසාරිස් විසින් ඊට අදාලව අය කරන ලද හිඟ හෝ දඩ මුදල පිළිබඳ විස්තර නැවත ලබා ගෙන අදාල ලේඛණ වල සටහන් කිරීමටත් ඒ පිළිබඳ නිසි සටහන් ඔප්පු වල තැබීමටත් අවශ්‍ය පියවර ගන්න.

05. මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගත් බවත් මා වෙත දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය පරිපාලනහා ස්වදේශ කටයුතු අමා. - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
2. සියළුම පළාත් ආදායම් කොමසාරිස්වරුන් වෙත - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
3. සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
4. විගණකාධිපති - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
5. ගණකාධිකාරී - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා